Library Copy 2024-09

# මීගමුව අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම 2024

## ව්‍යාපාර සහ ගිණුම්කරණ අධ්‍යයනය - I කොටස

10 ශ්‍රේණිය

කාලය පැය 1

පොදු උපදෙස් -

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3) සහ (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරන්න.

පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

විමුක්ති කුඩා දරුවන් සඳහා ටී ෂර්ට් මැසීම සඳහා ගෘහස්ථ ඇඟලුම් කම්හලක් ආරම්භ කරයි. ඔහු රජයේ විශ්ව විද්‍යාලයක කුඩා ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා ඇත. ඔහු සිය ව්‍යාපාරය "විමු ටී ෂර්ට්" ලෙස නම් කළේ ය. ඔහු සිය නිෂ්පාදිත සඳහා අවශ්‍ය රෙදි ආනයනය කරන බැවින් ඩොලරයේ අගය ඉහළ යාම, ඔහුට ගැටලුවක්ව පවතී. විමුක්ති සිය ව්‍යාපාරයේ නිෂ්පාදන කළමනාකාරිනිය ලෙස ඇඟලුම් ක්ෂේත්‍රයේ දස වසරක පළපුරුද්දක් ඇති නෙහාරා ද, යන්ත්‍ර ක්‍රියාකාරිණියන් ලෙස මෑතක දී පාසල් අධ්‍යාපනය නිමකළ තරුණියන් පස් දෙනෙකු ද බඳවා ගන්නා ලදි.

(1) "විමු ටී ෂර්ට්" ආයතනය භාවිතා කරන "රෙදි" අයත් නිෂ්පාදන සාධකය වන්නේ,

1. භූමිය 2. ශ්‍රමය 3. ප්‍රාග්ධනය 4. ව්‍යවසායකත්වය

(2) නිෂ්පාදිතයෙහි ස්වභාවය අනුව විමු ටී ෂර්ට් ව්‍යාපාරය අයත් ව්‍යාපාර වර්ගය වන්නේ,

1. සැපයීමේ ව්‍යාපාර
2. තනි පුද්ගල ව්‍යාපාර
3. කුඩා පරිමාණ ව්‍යාපාර
4. භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර

(3) විමුක්තිගේ ව්‍යාපාරයේ දුර්වලතාවයක් වන්නේ,

1. විමුක්ති කුඩා ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා තිබීම.
2. නිෂ්පාදන කළමනාකාරිණිය ලෙස නෙහාරා බඳවා ගැනීම.
3. ක්‍රියාකාරිනියන් ලෙස නුපුහුණු තරුණියන් බඳවා ගැනීම.
4. එක්සත් ජනපද ඩොලරයේ අගය ඉහළ යාම.

(4) "විමු ටී ෂර්ට්" ව්‍යාපාරය ලියාපදිංචියට අදාල නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1. "විමු ටී ෂර්ට්" ව්‍යාපාර නාමය ලියාපදිංචි කර තිබුණ ද එය ලියාපදිංචි කිරීම අනිවාර්ය නොවේ.
2. "විමු ටී ෂර්ට්" ව්‍යාපාරයේ නාමය 1890 හවුල් ව්‍යාපාර ආඥා පනත යටතේ ලියාපදිංචි කළ යුතු ය.
3. ඉහත ව්‍යාපාරය ලියාපදිංචිය මගින් එයට නීතිමය පුද්ගලභාවයක් හිමි වේ.
4. ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමට අදාළ බලධාරියා වන්නේ පළාත් සභාවේ ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර්වරයා ය.

Learning Resource Center
R
De Mazenod College
Kandana

(5) එක්සත් ජනපද ඩොලරයේ අගය ඉහල යාම මෙම ව්‍යාපාරයේ ...............පරිසරයට අයත් වේ.

1. අභ්‍යන්තර 2. ගෝලීය 3. දේශපාලන 4. ආර්ථික

(6) ව්‍යාපාර සංකල්පය බිහි වූයේ,

1. කාර්මික විප්ලවය තුළිනි. 2. විද්‍යුත් වාණිජය තුළිනි
3. භාණ්ඩ හුවමාරුව තුළිනි. 4. සෘජු නිෂ්පාදනය තුළිනි

(7) අවශ්‍යතාවල ලක්ෂණයක් නොවන පිළිතුර තෝරන්න.

1. අත්‍යවශ්‍ය වීම. 2. විවිධ වීම. 3. සංකීර්ණ වීම. 4. අසීමිත වීම.

(8) පහත දැක්වෙන දෑ අතුරින් සේවා සැපයීමේ ව්‍යාපාරයක් වන්නේ කුමක් ද?

1. WMB මෝටර් රථ නිෂ්පාදන සමාගම
2. හැටන් ප්‍රදේශයේ එළවළු වගාවක්
3. දුන්හිඳ පානීය ජල බෝතල් නිෂ්පාදන සමාගම
4. ගාල්ලේ CNB සුපිරි වෙළඳසැල

(9) ව්‍යාපාර අවධානම් දරමින් නව්‍යතා සම්පාදනය කරමින් ව්‍යාපාර කටයුතු පිළිබඳව තීරණ ගැනීම සිදුකරන තැනැත්තා වන්නේ,

1. ව්‍යවසායකයා ය. 2. කළමණාකරුවා ය.
3. ආයෝජකයා ය. 4. සේවකයා ය.

(10) අඛණ්ඩව ඇණවුම් ලබා ගැනීමේ අරමුණින් ව්‍යාපාරයක් කෙරෙහි උනන්දුවක් දක්වන ඇල්මැති පාර්ශවය වන්නේ,

1. කළමනාකරුවන් 2. සැපයුම්කරුවන් 3. පාරිභෝගිකයින් 4. තරඟකරුවන්

(11) 2007 අංක 07 දරණ සමාගම් පනත ක්‍රියාත්මක කරනු ලබන සමාගම් රෙජිස්ට්‍රාර්වරයා අයත් වන්නේ,

1. දේශපාලන පරිසරයට ය. 2. නෛතික පරිසරයට ය.
3. ආර්ථික පරිසරයට ය. 4 ගෝලීය පරිසරයට ය.

(12) "ගෝලීයකරණය" යන්නෙහි අර්ථය වන්නේ,

1. රටක් ලෝකයේ වෙනත් රටවල් වලින් භාණ්ඩ හෝ සේවා මිලදී ගැනීම ය.
2. වෙළඳ කටයුතුවලට සහායවීම සඳහා විවිධ රටවල් එක්ව විවිධ ආර්ථික කලාප පිහිටුවා ගැනීම ය.
3. ලෝකයේ රටවල් අතර ආර්ථික සමාජයීය හා සංස්කෘතික වශයෙන් ඇති අන්‍යෝන්‍ය බැඳීම ය.
4. එකම පොදු මුදල් ඒකකයක් භාවිතයෙන් ලෝකයේ සියලුම රටවල් එක් විශ්ව ගම්මානයක් බවට පත්වීම ය.

(13) පහත දැක්වෙන දැ අතුරෙන් ව්‍යාපාර අවස්ථාවක් වන්නේ කුමක් ද?

1. ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් තිබීම ය. 2. සේවකයන්ගේ අයහපත් ආකල්ප ය.
3. අධිවේගී මාර්ග ඉදිකිරීම ය. 4. ස්වභාවික ආපදාවන් ය.

(14) පෞද්ගලික අංශයට අයත් ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාර සංවිධාන පමණක් ම දැක්වෙන පිළිතුර තෝරන්න.

1. හවුල් ව්‍යාපාර, සමුපකාර 2. සමුපකාර, සමිති සංවිධාන
3. සංස්ථා, සමිති සංවිධාන 4. සංස්ථා, සමුපකාර

(15) හවුල් ව්‍යාපාරයක ආරම්භක ප්‍රාග්ධනය රුපියල් 1000 හෝ ඊට වඩා වැඩිනම්, එම ව්‍යාපාරය ලිඛිත ගිවිසුමකින් පවත්වා ගත යුතු බව ප්‍රකාශ කරන නීතිය වන්නේ,

1. හවුල් ව්‍යාපාර ආඥා පනත 2. සමාගම් පණත
3. වංචා වැළැක්වීමේ ආඥා පනත 4. ව්‍යාපාර නාම ආඥා පනත

(16) නෛතික පුද්ගලභාවයක් නොමැති ව්‍යාපාර සංවිධාන පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.

1. තනි පුද්ගල ව්‍යාපාර, සංස්ථාපිත සමාගම් 2. හවුල් ව්‍යාපාර, තනි පුද්ගල ව්‍යාපාර
3. රාජ්‍ය සංස්ථා, රජයේ දෙපාර්තමේන්තු 4. සංස්ථාපිත සමාගම්, රජයේ දෙපාර්තමේන්තු

(17) ෂෙහාරාගේ ව්‍යාපාරයේ සිදු වූ සිද්ධියක් ලෙස සැලකිය හැක්කේ,

1. රු.20,000ක බඩු තොග විකිණීම 2. රු. 5,000ක වෙළඳ බඩු තොගයක් විනාශ වීම
3. රු.7,000 ක මාසික වැටුප් ගෙවීම 4. රු.100,000ක බැංකු ණයක් ලබා ගැනීම

(18) ව්‍යාපාරයක දැකිය හැකි ජංගම නොවන වත්කම් පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.

1. මෝටර් රථ, ලී බඩු, ඉඩම් හා ගොඩනැගිලි, යන්ත්‍රෝපකරණ
2. මුදල්, ලී බඩු හා සවිකිරීම, යන්ත්‍රෝපකරණ, මෝටර් රථ
3. ඉඩම් හා ගොඩනැගිලි, විකිණීමට ඇති බඩු තොග, මුදල්, ණය ගැතියෝ
4. මෝටර් රථ, ලැබිය යුතු ආදායම්, ලී බඩු, මුදල්

Learning Resource Center
R
De Mazenod College
Kandana

(19) අයිතිකරු විසින් සිදු කරනු ලබන ගැනිලි නිසා සිදුවන හිමිකම හි අඩුවීම හැර, අවින්තගේ ව්‍යාපාරයේ හිමිකම අඩුවිය හැක්කේ කෙසේ ද?

1. ආදායම් නිසා 2. වියදම් නිසා 3. ගනුදෙනුවක් නිසා 4. වත්කමක් නිසා

(20) ව්‍යාපාරයක හිමිකමෙ හි වැඩිවීමක් ඇතිවීමට බලපෑ හැකි ගණුදෙනුව වන්නේ,

1. රු.80,000ක් වටිනා බඩු තොගයක් විකිණීම
2. ණය හිමියන්ට රු.7,000ක මුදලක් ගෙවීම
3. දුරකථන ගාස්තු රු.3,000ක් ගෙවීම
4. රු.4000ක ගොඩනැගිලි කුලී ලැබීම

(21) ශලිනිගේ ව්‍යාපාරයේ 2024.06.01 දිනට ගිණුම්කරණ සමීකරණය පහත පරිදි විය.

වත්කම් (රු.66,000) = හිමිකම් (රු.45,000) + වගකීම් (රු.21,000)

2024/06/07 දිනෙන් අවසන් සතිය තුළ පහත ගණුදෙනු සිදු විය.

06/02 - අයිතිකරු රු.20,000 ක ප්‍රාග්ධනයක් යෙදීම

07/06 - ණය ගැතියෙකුගෙන් රු.15000ක මුදලක් ලැබීම

2024/06/07 දින පැවති නිවැරදි ගිණුම්කරණ සමීකරණය වන්නේ,

1. වත්කම් (රු.101,000) = හිමිකම් (රු.65,000) + වගකීම් (රු.36,000)
2. වත්කම් (රු.86,000) = හිමිකම් (රු.65,000) + වගකීම් (රු.21,000)
3. වත්කම් (රු.46,000) = හිමිකම් (රු.25,000) + වගකීම් (රු.21,000)
4. වත්කම් (රු.31,000) = හිමිකම් (රු.25,000) + වගකීම් (රු.6,000)

(22) ඖෂධ අලෙවි සැලක වගකීම් මත බලපෑමක් ඇති නොකරන ගණුදෙනුව කුමක් ද?

1. රු.10,000ක ඖෂධ ද්‍රව්‍ය ණයට ගැනීම
2. රු.25,000ක පරිගණකයන්ත්‍රයක් ණයට ගැනීම
3. බැංකු ණයවාරිකය ලෙස රු.50,000ක මුදලක් ගෙවීම
4. ව්‍යාපාරයේ ණය ගැතියකුගෙන් රු.60,000 ක මුදලක් ලැබීම

(23) 2024 /07/31 දිනෙන් අවසන් මාසයට අදාළව රුවින්කගේ ව්‍යාපාරයේ පොත්වලින් පහත තොරතුරු උපුටාගෙන ඇත.

ප්‍රාග්ධනය (2024/07/01 දිනට) රු. 41,500

මාසය තුළ ලද අදායම රු. 23,000

මාසයට අදාළ අදායම රු.8,000

මාසය තුළ අතිරේක ප්‍රාග්ධන යෙදීම රු.20,000

2024/07/31 දිනට ව්‍යාපාර අයිතිකරුගේ හිමිකම කොපමණ ද?

1. රු. 5,000
2. රු.46,500
3. රු.61,500
4. රු.66,500

පහත තොරතුරු ඇසුරෙන් ප්‍රශ්න අංක 24 හා 25 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

2024.08.01 දිනට රන්මිණිගේ ව්‍යාපාරයේ පොත්වලින් උපුටාගත් තොරතුරු පහත දැක් වේ.

| | |
|---|---|
| ලී බඩු රු. 35,000 | මුදල් රු. 14,000 |
| බඩු තොගය රු. 17,000 | බැංකු ණය රු.22,000 |
| ණය ගැතියෝ රු.8,000 | ණය හිමියෝ රු.9,000 |

(24) 2024.08.01 දිනට ව්‍යාපාරයේ මුළු වගකීම් ප්‍රමාණය ගණනය කරන්න.

1. රු.9,000 2. රු.22,000 3. රු.31,000 4. රු.39,000

(25) 2024.08.01 දිනට ජංගම වත්කම්වල වටිනාකම වන්නේ,

1. රු.14,000 2. රු.35,000 3. රු.39,000 4. රු.74,000

(26) ව්‍යාපාරයක ලෙජරයේ ඇති ඇති ගැනිලි ගිණුම,

1. වියදම් ගිණුමකි 2. ආදායම් ගිණුමකි 3. හිමිකම් ගිණුමකි 4. වත්කම් ගිණුමකි

(27) "වැඩිවීම හර සහ අඩුවීම බැර" ලෙස ද්විත්ව සටහන් මූලධර්මය අදාළ වන ගිණුම් පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.

1. මුදල් ගිණුම, ණයගැති ගිණුම, ණය හිමි ගිණුම
2. ලීබඩු ගිණුම, විදුලි වියදම් ගිණුම, මුදල් ගිණුම
3. බැංකු ණය ගිණුම, ණය හිමි ගිණුම, ප්‍රාග්ධන ගිණුම
4. යන්ත්‍ර ගිණුම, ගැනුම් ගිණුම, ණය හිමි ගිණුම

(28) එක්තරා ගනුදෙනුවක් ගිණුම්ගත කිරීමේ දී එහි ද්විත්ව සටහනෙන් එක් සටහනක් ණයගැති ගිණුමට හර කරන ලදි. මෙහි දී ගිණුම්ගත කරන ලද ගනුදෙනුව තෝරන්න.

1. රු.40,000ක බඩු තොගයක් ණයට විකිණීම
2. රු.35,000 ක බඩු තොගයක් ණයට ගැනීම.
3. ණයහිමියකු පියවීම සඳහා රු.23,000 ක මුදල් ගෙවීම.
4. රු.31,000ක මුදලක් ණයගැතියෙකුගෙන් ලැබීම.

(29) පහත දැක්වෙන ගිණුම් අතුරින් ගනුදෙනුවක් වාර්තා කිරීමේ දී බැර පැත්තේ සටහන් නොයෙදෙන ගිණුම තෝරන්න.

1. මුදල් ගිණුම 2. ණය ගැති ගිණුම 3. විකුණුම් ගිණුම 4. විදුලි ගාස්තු ගිණුම



REGISTRAR
De Mazenod College
Kandana.

පහත තොරතුරු ඇසුරෙන් අංක 30 සිට 34 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

විභාෂි ෆොටර්ස් ව්‍යාපාරයේ 2024 ජූලි මාසය තුළ දී සිදු වූ ගනුදෙනු පහත දැක්වේ.

A. රු.40,000ක බඩු තොගයක් ණයට ගැනීම.

B. රු. 25,000 ක යන්ත්‍රයක් අත්පිට මුදලට ගැනීම.

C. රු. 40,000ක් වටිනා බඩු තොගයක්, රු.55,000ට අත්පිට මුදලට විකිණීම.

D. ණය ගැතියෙකුගෙන් රු.12,000ක මුදලක් ලැබීම.

(30) ව්‍යාපාරයේ වත්කම් මත බලපෑමක් ඇති කරනු ලබන ගනු දෙනු තෝරන්න.

1. A හා B පමණි. 2. B හා D පමණි.
3. A, B හා C පමණි. 4. A, B, C, D යන සියල්ලම.

(31) 2024.07.31 දිනට ව්‍යාපාරයේ හිමිකමෙහි සිදුවන අගය වැඩිවීම වන්නේ,

1. රු. 15,000.00 2. රු.27,000.00 3. රු.55,000.00 4. රු. 67,000.00

(32) විභාශිගේ ව්‍යාපාරයේ 2024/07/01 දිනට පැවති මුළු වත්කම්වල අගය රු.50,000.00 ලෙස සලකා 2024.07.31 දිනට මුලුවත්කම්වල අගය ගණනය කරන්න

1. රු. 25,000 2. රු.67,000 3. රු.92,000 4. රු. 104,000

(33) පහත දැක්වෙන ප්‍රකාශ සම්පූර්ණ කිරීම සඳහා ගැලපෙන වාක්‍යඛණ්ඩය තෝරන්න.

"……………… ව්‍යාපාරයේ වත්කම් හා වගකීම් මත බලපෑමක් ඇති කරයි."

1. A ගණුදෙනුව පමණක් 2. A හා B ගණුදෙනු පමණක්
3. A,B හා C ගණුදෙනු පමණක් 4 . A, B, C හා D ගණුදෙනු සියල්ලම.

(34) ඉහත ගණු දෙනු වාර්තා කිරීමේ දී යොදා ගැනෙන මූලාශ්‍ර ලේඛනයක් නොවන්නේ,

1. ගැනුම් ඉන්වොයිසිය 2. ජ්නල් වවුචරය 3. ලදු පත 4. ගෙවීම් වවුචරය

(35) මූලික සටහන් පොත් සඳහා භාවිතා කරනු ලබන නමක් නොවන්නේ,

1. ජ්නල් 2. ලෙජරය 3. දෛනික පොත් 4. උපයෝගී පොත්

(36) සෙහන්සා රු.3,000ක බඩු තොගයක් ණයට ගෙන ඇගේ ව්‍යාපාරය විදුලි ගාස්තු ලෙස රු2,000ක් ගෙව්වා ය. ඉන්පසුව ඇය රු.12,000ක බඩු තොගයක් අත්පිට මිදුලට මුදලට විකුණුවා ය.

ඉහත ගණුදෙනුව ගිණුම් ගත කිරීමට අදාළ මූලාශ්‍ර ලේඛන අනුපිළිවෙලින් දක්වන පිළිතුරු තෝරන්න.

1. ගැණුම් ජ්නලය, මුදල් පොත, විකුණුම් ජ්නලය
2. ගැණුම් ඉන්වොයිසිය, ගෙවීම් වවුචරය, ලදු පත
3. ගෙවීම් වවුචරය, මුදල් පොත, විකුණුම් ඉන්වොයිසිය
4. ගැණුම් ඉන්වොයිසිය, ලදු පත, විකුණුම් ඉන්වොයිසිය



REGISTRAR
De Mazenod College
Kandana.

(37) ගිණුම්කරණයේ භාවිතා වන මූලික සටහන් පොත් හා මූලාශ්‍ර ලේඛන පිළිබඳව සිදුකරන ලද ප්‍රකාශනයන් 02ක් පහත දැක්වේ.

A ව්‍යාපාරයේ සිදුවන සියලුම ගණුදෙනු එකම මූලික සටහන් පොතක සටහන් කිරීම වඩාත් යෝග්‍ය වේ.

B මූලාශ්‍ර ලේඛන යොදා ගනිමින් ව්‍යාපාර ගණුදෙනු මූලික සටහන් පොත්වල සටහන් කරයි.

ඉහත ප්‍රකාශ අතුරෙන්,

1. A හා B ප්‍රකාශ දෙකම සත්‍ය වේ.
2. A හා B ප්‍රකාශ දෙකම අසත්‍ය වේ.
3. A ප්‍රකාශය සත්‍ය වන අතර B ප්‍රකාශය අසත්‍ය වේ.
4. B ප්‍රකාශය සත්‍ය වන අතර A ප්‍රකාශය අසත්‍ය වේ.

(38) ව්‍යාපාරයක ගනුදෙනුවක් සටහන් කිරීමට යොදාගත් බැර සටහන පහත දැක්වේ.

මුදල් ගිණුම බැර රු. 2,700
ලදවට්ටම් ගිණුම බැර රු.300

ඉහත ගිණුම් ගත කර ඇති ගණුදෙනුව කුමක් ද?

1. රු. 300ක වට්ටමක් අඩුකිරීමෙන් අනතුරුව රුපියල් 3,000ක බඩු තොගයක් අත්පිට මුදලට ගැනීම
2. රු. 300ක වට්ටමක් අඩුකිරීමෙන් අනතුරුව රු.3,000ක බඩු තොගයක් ණයට ගැනීම
3. රු.3,000ක ණය හිමියෙකුට 10%ක වට්ටමකට යටත්ව මුදල් ගෙවීම
4. රු.3,000ක ණයගැතියෙකුගෙන් 10%ක වට්ටමකට යටත්ව මුදල් ලැබීම

පහත තොරතුරු උපයෝගී කරගනිමින් අංක (39) හා (40) ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

චංචලා ගේ ව්‍යාපාරයේ 2024/07/31 දිනට සුලු මුදල් ශේෂය රු.800ක් වේ. 2024/08/01 දින ප්‍රතිපූරණය කරන ලද මුදල රු.1200 කි. 2024/08/31 දිනෙන් අවසන් මාසය තුල සුලු මුදල් වියදම රු.1900 කි.

(39) චංචලාගේ ව්‍යාපාරයේ සුලු මුදල් අග්‍රිමයේ වටිනාකම කොපමණ ද?

1. රු. 800 යි. 2. රු.1200 යි. 3. රු.2000 යි. 4. රු. 2800 යි.

(40) 2024/09/01 දින අග්‍රිමය ප්‍රතිපූරණය කළ යුතු වටිනාකම වන්නේ,

1. රු.1000 යි. 2. රු.800 යි. 3. රු.1900 යි. 4. රු.2100 යි.



REGISTRAR
De Mazenod College
Kandana.

2024.09

Library Copy.

# මීගමුව අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම 2024

## ව්‍යාපාර සහ ගිණුම්කරණ අධ්‍යයනය - II කොටස

**10 ශ්‍රේණිය**

**කාලය පැය 2**

පොදු උපදෙස් -

- පළමුවන ප්‍රශ්නය ඇතුළුව I කොටසින් ප්‍රශ්න දෙකක් ද, II කොටසින් ප්‍රශ්න දෙකක් ද බැගින් තෝරා ගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

(1) පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක (i) සිට (x) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උපාධිධාරිණියක් වන හිරුණි සිය මිතුරියක වන සඳුනි හා එක්ව නිමි ඇඳුම් අලෙවි කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කළා ය. ඔවුන් තම ව්‍යාපාරය "හිරු සඳු ඩ්‍රෙස් පොයින්ට්" ලෙස නම් කළෝ ය. සඳුනිට අයත් වූ රු.100,000ක් වටිනා ගොඩනැගිල්ලක ව්‍යාපාරය ස්ථාපනය කරන ලදී.

2024 /08/ 31 දිනෙන් අවසන් වන මාසය තුළ ඉහත ව්‍යාපාරය සිදු වූ ගනුදෙනු පහත දැක්වේ.

- හිරුණි ප්‍රාග්ධනය ලෙස යෙදූ මුදල රු.15,000
- මාසය තුළ විකුණුම් අත්පිට මුදලට රු.230,000
  ණයට රු.70,000
- ඇඟලුම් මිලදී ගැනීම අත්පිට මුදලට රු.130,000
  ණයට රු.100,000
- කාර්යාල උපකරණ ය මිලදී ගැනීම රු.50,000
- විදුලි ගාස්තු ගෙවීම රු.7,000
- සේවක වැටුප් හා වේතන ගෙවීම රු.10,000
- බැංකු ණයක් ලබාගත්තා රු.50,000

අතිරේක තොරතුරු - 2024/08/31 දිනට ඉතිරි තොග කිසිවක් නොමැත.

"හිරු සඳු ඩ්‍රෙස් පොයින්ට්" ආයතනය තම ප්‍රචාරණ කටයුතු සඳහා සිය වෙබ් අඩවිය යොදාගන්නා අතර මාර්ගගතව භාණ්ඩ මිල දී ගැනීමේ පහසුකම ද සලසයි. 2025/01/01 දින සිට සිය ව්‍යාපාරය සංස්ථාපිත සමාගමක් බවට පරිවර්තනය කිරීමට හිරුණි සහ සඳුනි සාකච්ඡා කරමින් සිටිති. පාරිභෝගික තෘප්තිය ඉහළ නැංවීම මගින් සිය ගනුදෙනුකරුවන් රඳවා ගැනීමට ඔවුන් නිතරම උත්සාහ කරයි.

Learning Resource Center
R
De Mazenod College
Kandy

(i) අ. "හිරු සඳු ඩ්‍රෙස් පොයින්ට්" ව්‍යාපාරය මගින් සපුරාලනු ලබන මිනිස් අවශ්‍යතාවය කුමක් ද?

ආ. අයිතිය හා අරමුණ අනුව "හිරු සඳු ඩ්‍රෙස් පොයින්ට්" ව්‍යාපාරය අයත් ව්‍යාපාර වර්ග වෙන වෙනම ලියන්න.

(ii) අ. ඉහත ව්‍යාපාරය භාවිතා කරනු ලබන නිෂ්පාදන සාධකයක් වන ප්‍රාග්ධනය සඳහා මෙහි දැක්වෙන නිදසුන් දෙකක් ලියන්න.

ආ. "හිරු සඳු ඩ්‍රෙස් පොයින්ට්" ව්‍යාපාරයේ අභ්‍යන්තර පරිසරයට අයත් සාධක දෙකක් නම් කරන්න.

(iii) අ. ඉහත සිද්ධිය තුළ දැක්වෙන ව්‍යාපාර අරමුණ කුමක් ද?

ආ. සිය සැපයුම්කරුවන් වෙතින් "හිරු සඳු ඩ්‍රෙස් පොයින්ට්" අපේක්ෂා කරන දායකත්වයන් දෙකක් සඳහන් කරන්න.

(iv) අ. ඉහත සිද්ධිය තුළ දැක්වෙන තාක්ෂණික පරිසරයට අදාල නිදසුනක් ලියන්න

ආ. ඉහත ව්‍යාපාරය වර්තමානයේ අයත් වන ව්‍යාපාර සංවිධාන වර්ගයට සාපේක්ෂව එය සංස්ථාපිත සමාගමක් බවට පරිවර්තනය කිරීමෙන් අත්කරගත හැකි වාසි දෙකක් ලියන්න.

(v) අයිතිකරුවන්ගේ ප්‍රාග්ධනය යෙදීමෙන් අනතුරුව, ඉහත ව්‍යාපාරයේ පැවති ගිණුම්කරණ සමීකරණය ලියා දක්වන්න

(vi) ඉහත ව්‍යාපාරයේ සිදුවූ පහත දැක්වෙන ගනුදෙනු ගිණුම් ගත කිරීමට අදාළ ද්විත්ව සටහන ලියා දක්වන්න.

අ. ණයට විකුණුම් රු. 70,000

ආ. බඩු තොග ණයට ගැනුම් රු.100,000

(vii) අ. "හිරු සඳු ඩ්‍රෙස් පොයින්ට්" ව්‍යාපාරයේ භාවිතා කරනු ලබන මූලාශ්‍ර ලේඛන දෙකක් ලියන්න.

ආ. ඉහත එක් එක් මූලාශ්‍ර ලේඛනවලට අදාළ ගණුදෙනුව බැගින් සිද්ධියෙන් උපුටා ලියන්න.

(viii) "හිරු සඳු ඩ්‍රෙස් පොයින්ට්" ව්‍යාපාරයේ මුදල් පොත සකස් කර 2024/08/31 දිනට මුදල් ශේෂය ගණනය කරන්න.

(ix) 2024/08/31 දිනට ව්‍යාපාරයේ මුළු වත්කම්වල වටිනාකම ගණනය කරන්න.

(x) 2024/08/31 දිනට "හිරු සඳු ඩ්‍රෙස් පොයින්ට්" ව්‍යාපාරයේ අයිතිකරුගේ හිමිකම ගණනය කරන්න.

(ලකුණු 02x10=20 )

2024.09

# I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

(ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න)

(2)

1. ව්‍යාපාරයක් යනු කුමක්දැයි හඳුන්වන්න.

(ලකුණු 02)

2. පහත සඳහන් ප්‍රකාශ සත්‍යය ද අසත්‍යය ද යන්න දක්වන්න.
   - අ. අවශ්‍යතා නිර්මාණය කළ හැකි අතර, උවමනා නිර්මාණය කළ නොහැක.
   - ආ. අවශ්‍යතා සපුරාලීම සඳහා යොදා ගන්නා ස්පර්ශ කළ හැකි භෞතික පැවැත්මක් ඇති දෑ භාණ්ඩ නම් වේ.
   - ඉ. විදුරු නිෂ්පාදනයේ දී යොදා ගන්නා බනිජ වැලි නිෂ්පාදන සාධකයක් වන භූමියට අයත් වේ.
   - ඊ. තවදුරටත් ණය සැපයීම අරමුණ කර ගනිමින් ප්‍රජාව ව්‍යාපාර කෙරෙහි ඇල්මක් දක්වයි.

(ලකුණු 02)

3. හිමාෂි තම නිවස පිටුපස බහුලව වැවී ඇති අඹ ගස්වලින් ලබාගන්නා අඹ යොදාගෙන අඹ චට්නි නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කළා ය. මේ සඳහා ඇය සීමිත යන්ත්‍රෝපකරණ ප්‍රමාණයක් භාවිතා කරන අතර නිෂ්පාදිත වෙළඳපොළට බෙදා හැරීම සඳහා අෂානිගේ සහාය ලබා ගනී.

   පහත ආකාරයේ වගුවක් භාවිතා කරමින්,
   - අ. හිමාෂිගේ ව්‍යාපාරයේ භාවිතා වන නිෂ්පාදන සාධක දෙකක් නම් කරන්න.
   - ආ. ඉහත (අ) හි ඔබ සඳහන් කළ නිෂ්පාදක සාධක සඳහා සිද්ධිය තුළ දැක්වෙන නිදසුන බැගින් උපුටා ලියන්න.

| අ. නිෂ්පාදන සාධකය | ආ. නිෂ්පාදන සාධකය සඳහා නිදසුන |
|---|---|
| | |

(ලකුණු 02)

4. සඳලි "SN ලිපිද්‍රව්‍ය" ව්‍යාපාරයේ හිමිකාරිණිය යි. ඇගේ ව්‍යාපාරයේ සේවිකාවන් දෙදෙනෙකු සේවය කරයි. ඇය ප්‍රධාන වශයෙන් ම ප්‍රදේශයේ පාසල්වල ලිපි ද්‍රව්‍ය අලෙවිසල් සඳහා අවශ්‍ය ලිපිද්‍රව්‍ය අලෙවි කරයි.
   - අ. "SN ලිපිද්‍රව්‍ය" ලිපි ද්‍රව්‍ය ආයතනයේ ඇල්මැති පාර්ශවයන් දෙකක් නම් කරන්න.
   - ආ. ඉහත (අ) හි ඔබ දැක් වූ එක් එක් ඇල්මැති පාර්ශවයේ අරමුණු බැගින් ලියන්න.

(ලකුණු 02)

(මුළු ලකුණු 08)

Learning Resource Center
R
De Mazenod College

(3) 1. උද්ධමනය යනු කුමක් ද?

(ලකුණු 02)

2. පහත සඳහන් ප්‍රකාශ සත්‍යය ද අසත්‍යය ද යන්න දක්වන්න

අ. ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) ජාත්‍යන්තර සබඳතා සඳහා නිදසුනකි.

ආ. සේවකයන්ගේ විශේෂිත දැනුම හා කැපවීම ව්‍යාපාරයකට ශක්තියකි.

ඉ. ශ්‍රී ලංකා රජය විසින් බැංකු පොලී අනුපාතය පහත හෙළීමට තීරණය කිරීම දේශපාලන පරිසරයට අයත් වේ.

ඊ. එංගලන්තයේ භාවිතා කරනු ලබන මුදල් ඒකකය යූරෝ වේ.

(ලකුණු 02)

3. සරත් පොල්කටු භාවිතයෙන් විසිතුරු භාණ්ඩ නිපදවීමේ ව්‍යාපාරයක් ආරම්භ කරයි. ඔහු තම නිෂ්පාදිත නිර්මාණය සඳහා පරිගණක මෘදුකාංගයක් යොදා ගනී. තම ව්‍යාපාරයේ පහසුව සඳහා විදේශ රටවලින් නවීන යන්ත්‍ර සූත්‍ර රැසක් මිල දී ගෙන ඇත.

අ. සරත් විසින් නිෂ්පාදිත නිර්මාණය සඳහා පරිගණක මෘදුකාංගයක් භාවිතා කිරීම, බාහිර පරිසරයේ කවර බලවේගයකට අයත් වේ ද?

ආ. ඉහත සිද්ධියේ දැක්වෙන බලපෑම හැර ගෝලීය පරිසරයෙන් දේශීය ව්‍යාපාර මත ඇති කරන හිතකර බලපෑම් දෙකක් නම් කරන්න.

(ලකුණු 02)

4. ජනිදු විසිතුරු මයුන් අලෙවි කිරීමේ ව්‍යාපාරයක හිමිකරු වේ. ඔහුගේ නිෂ්පාදන සඳහා සංචාරක හෝටල් වෙතින් ඉහළ ඉල්ලුමක් පවතී. කෙසේ වුව ද ඔහු සිය ව්‍යාපාරය පුළුල් කිරීම සඳහා අවශ්‍ය ප්‍රාග්ධන හිඟකමකට මුහුණ දෙයි.

අ. ජනිදුගේ ව්‍යාපාරයේ දුර්වලතාවයක් සහ අවස්ථාවක් ලියන්න.

ආ. ජනිදුගේ ව්‍යාපාරයේ අභ්‍යන්තර පරිසරයට හා බාහිර පරිසරයට අයත් වන පාර්ශ්වය බැගින් නම් කරන්න.

(ලකුණු 02)

(මුළු ලකුණු 08)

(4) 1. නිෂ්පාදිතයේ ස්වභාවය අනුව ව්‍යාපාර බෙදිය හැකි වර්ග දෙක නම් කරන්න

(ලකුණු 02)

2. පහත සඳහන් ප්‍රකාශ සත්‍යය ද අසත්‍යය ද යන්න දක්වන්න

අ. ලංකා විදුලිබල මණ්ඩලය, රාජ්‍ය සංස්ථා සඳහා නිදසුනකි

ආ. 2007 අංක 07 දරණ සමාගම් පණත හවුල් ව්‍යාපාර මත කිසිදු බලපෑමක් ඇති නොකරයි.

ඉ. සමුපකාර සමිතියක් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය අවම සාමාජික සංඛ්‍යාව 10 කි.

ඊ. තනි පුද්ගල ව්‍යාපාරයක නාමය ලියාපදිංචි කිරීමෙන් එයට නෛතික පුද්ගලභාවයක් හිමිවෙයි.

(ලකුණු 02)

3. දෙව්මි හා ඔෂිණි එක්ව ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අපේක්ෂා කරන මිතුරියන් දෙදෙනෙකි. නීතිමය පුද්ගල භාවයක් නොමැති එසේම වගකීම අසීමිත වූ ව්‍යාපාර සංවිධාන ක්‍රමයක් යොදා ගැනීමට දෙව්මි එකඟතාවය පළ කර ඇත. එහෙත් ඔෂිණි පවසනුයේ නීතිමය පුද්ගලභාවයක් සහිත වගකීම සීමා සහිත වන ව්‍යාපාර සංවිධාන ක්‍රමයක් යොදා ගැනීම යෝග්‍ය බව ය.

අ. දෙව්මිට අනුව ඔවුන්ට යොදා ගැනීමට සුදුසු ව්‍යාපාර සංවිධාන ක්‍රමය නම් කරන්න

ආ. ඔෂිණිට අනුව ඔවුන්ට යොදාගැනීමට සුදුසු ව්‍යාපාර සංවිධානය ක්‍රමය නම් කරන්න.

(ලකුණු 02)

4. රණසිංහ මහතා ප්ලාස්ටික් පුටු නිෂ්පාදනය කරනු ලබන තනි පුද්ගල ව්‍යාපාරයක හිමිකරුවෙකි. ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව භාවිතා කරනු ලබන නිර්ණායකය අනුව ඔහුගේ ව්‍යාපාරය, කුඩා පරිමාණ ව්‍යාපාරයක් ලෙස හඳුනා ගනී.

අ. රණසිංහ මහතා භාවිතා කරනු ලබන ව්‍යාපාර සංවිධාන ක්‍රමය දැකිය හැකි බව සි දෙකක් ලියන්න

ආ. ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව ඉහත ව්‍යාපාරය, කුඩා ව්‍යාපාරයක් ලෙස හඳුනා ගැනීමට යොදාගෙන ඇති නිර්ණායකය කුමක් ද?

(ලකුණු 02)

(මුළු ලකුණු 08)

## II කොටස ගිණුම්කරණය
(ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න)

(5) 1. ගිණුම්කරණයේ ප්‍රධාන අරමුණ කුමක්ද.

(ලකුණු 02)

2. අ. වත්කමක් යනු කුමක් ද?

ආ. වගකීමක දැකිය හැකි ලක්ෂණ දෙකක් ලියන්න.

(ලකුණු 02)

3. අමායාගේ ව්‍යාපාරය 2024 /08/01 දින රු. 50,000ක බැංකු ණයක් ලබා ගැනීම හා රු.30,000ක ලී බඩු මිල දී ගැනීම සිදුකරන ලදී. පසු දින ඔවුන් විසින් එයින් රු. 15,000 ක බඩු තොගයක් ණයට ගන්නා ලදී. මාසය තුළ සිදු කරන ලද අමායාගේ මුදල් ගැනිලිවල වටිනාකම රු.2,000කි.

අමායාගේ ව්‍යාපාරය විසින් සකස් කළ යුතු පහත එක් එක් වර්ගයන්ට අයත් ගිණුම් සඳහා නිදසුන බැගින් ලියන්න.

අ. වත්කම් ගිණුම

ආ. වියදම් ගිණුම

ඉ. හිමිකම් ගිණුම

ඊ. වගකීම් ගිණුම

(ලකුණු 04)

4. 2024/08/14 දිනෙන් අවසන් සතිය තුළ ඉෂාරාගේ ව්‍යාපාරයේ සිදු වූ ගනුදෙනු පහත දැක්වේ.

අ. ණයගැතියන්ගෙන් රු.80,000ක මුදලක් ලැබීම.

ආ. අත්පිට මුදලට බඩු තොග ගැනීම රු.40,000

ඉ. කාර්යාල උපකරණ රු.10,000ට ගැනීම

ඊ. ණයහිමියෙකු පියවීම සඳහා රු.14,000ක මුදල් ගෙවීම

අවශ්‍ය වන්නේ;

ඉහත ගනුදෙනු ඉෂාරාගේ ව්‍යාපාරයේ මූලික ගිණුම් සමීකරණයට බලපාන ආකාරය දැක්වීම.

(ලකුණු 04)

(මුළු ලකුණු 12)

(6) 1. මුදල් පොතක ද්විත්ව කාර්යයන් නම් කරන්න.

(ලකුණු 02)

2. අ. මූලාශ්‍ර ලේඛනයක දැකිය හැකි සාමාන්‍ය කරුණු දෙකක් ලියන්න.

ආ. ගණුදෙනු මූලික පොත්වල සටහන් කිරීම අවශ්‍ය වීමට හේතු දෙකක් ලියන්න.

(ලකුණු 02)

3. ළිහිණි වෙළඳුන්ගේ ව්‍යාපාරයේ 2024 /08 / 31 සතියට අදාලව පොත්වලින් උපුටා ගත් ගණුදෙනු පහත දැක්වෙයි.

අ. ළිහිණි රු.100,000ක් ආයෝජනය කර ව්‍යාපාරය ආරම්භ කිරීම

ආ. රු.80,000ක බඩු තොගයක් ණයට ගැනීම

ඉ. ජංගම ගිණුමක් විවෘත කිරීම සඳහා රු.12,000ක මුදලක් තැන්පත් කිරීම

ඊ. ළිහිණි රු. 30,000ක් වටිනා ලී බඩු ව්‍යාපාරයට යෙදවීම

අවශ්‍ය වන්නේ;

පහත ආකාරයේ වගුවක් භාවිතා කරමින් ඉහත ගණුදෙනු වාර්තා කිරීමට මූලික පොත හා මූලාශ්‍ර ලේඛනය නම් කරන්න.

| ගණුදෙනුව | මූලික සටහන් පොත | මූලාශ්‍ර ලේඛනය |
|---|---|---|
| අ. | | |

(ලකුණු 04)

4. කුසුම්ගේ ව්‍යාපාරයේ පොත්වලින් පහත තොරතුරු උපුටාගෙන ඇත.

8/1 මුදල් ශේෂය රු.14,000 යි.

8/2 බැංකු ණයක් ලබාගත්තා රු. 40,000යි.

8/3 10% වට්ටමක් ලබා ගනිමින් රු. 5000ක ණය හිමියෙකුට මුදල් ගෙවීම.

8/4 ගොඩනැගිලි කුලිය ගෙවවා රු.7,000යි.

8/5 5% ක වට්ටමක් ලබා දී රු.6,000ක ණයගැතියෙකුගෙන් මුදල් ලබා ගැනීම.

8/6 රු.20,000ක පරිගණකයක් මිල දී ගැනීම.

අවශ්‍ය වන්නේ;

අ. 2024/08/07 දිනෙන් අවසන් සතිය සඳහා වට්ටම් තීරු සහිත මුදල් පොතක් සකස් කර එය තුලණය කිරීම.

ආ. කුසුම්ගේ ව්‍යාපාරයේ දුන් වට්ටම හා ලද වට්ටම ගිණුම් සකස් කිරීම.

(ලකුණු 04)

(මුළු ලකුණු 12)



REGISTRAR
De Mazenod College
Kandana.

(7) 1. මුදල් වට්ටමක් යනු කුමක් ද?

(ලකුණු 02)

2. ඇ. සුලු මුදල් ප්‍රතිපූරණය කිරීම යනු කුමක් ද?

ආ. සුලු මුදල් අග්‍රිමය ප්‍රතිපූරණය කිරීම වාර්තා කිරීමට අදාළ ද්විත්ව සටහන ලියන්න.

(ලකුණු 02)

3. 2024/08/07 දිනෙන් අවසන් සතිය තුළ කළණගේ ව්‍යාපාරයේ සිදු වූ ගණුදෙනු පහත දැක් වේ.

08/01 සුලු මුදල් ශේෂය රු.170 යි.

සුලු මුදල් අග්‍රිමය ප්‍රතිපූරණය කළා.

08/02 තැපැල් වියදම් රු.100 යි.

08/03 ගමන් වියදම් රු. 150 යි.

ලිපි ද්‍රව්‍ය සඳහා රු. 120 යි.

08/04 ත්‍රී රෝද රථ කුලිය රු. 330 යි.

සංග්‍රහ වියදම් රු. 370 යි.

08/05 මුද්දර හා තැපැල් පත් රු. 240 යි.

ණය හිමියෙකු වූ ආලෝකාට ගෙව්වා රු. 500 යි.

08/06 පිරිසිදු කිරීමේ වියදම් රු. 100 යි.

08/08 සුලු මුදල් අග්‍රිමය ප්‍රතිපූරණය කළා.

අමතර තොරතුරු

- සතියක කාලයක් සඳහා ව්‍යාපාරයේ සුලු මුදල් අග්‍රිමය රු.2000 කි.
- තැපැල් ගාස්තු, ප්‍රවාහන, ලිපි ද්‍රව්‍ය හා විවිධ යන විශ්ලේෂණ තීරු සහිත සුලු මුදල් පොතක් පවත්වාගෙන යාම ව්‍යාපාරයේ සම්ප්‍රදායවේ.

අවශ්‍ය වන්නේ;

(අ) කළණගේ ව්‍යාපාරයේ 2024/08/07 දිනෙන් අවසන් සතිය සඳහා සුලු මුදල් පොත සකස් කිරීම.

(ආ) සුලු මුදල්පොතේ ගණුදෙනු පිටපත් කරමින් ලෙජර් ගිණුම්

(ලකුණු 08)

(මුළු ලකුණු 12)



REGISTRAR
De Mazenod College
Kandana.